**3.0 නාට්‍ය හා රංගකලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.**

**3.2 නිර්දිෂ්ට පෙළ ඇසුරින් විවිධ චරිත නිරූපණය කරයි.**

**"සංවාද භාවිතා කරමු"**

"සංවාද හා දෙබස්",දෙබස් හා සංවාද වලට නාට්‍යයක ප්‍රබල ස්ථානයක් හිමි වන බව අප දනිමු.නාට්‍යයක් ඉදිරියට ගලා ගෙන යෑමට දෙබස් හා සංවාද අනිවාර්යයෙන් උවමනා වෙයි.සංවාද භාවිතා කරන ආකාරය නාට්‍යයේ ශෛලියට අනුව තීරණය වෙයි.නාට්‍ය ධර්මී නාට්‍ය ශෛලියේ නාට්‍ය වලදී සහ ලෝක ධර්මී නාට්‍ය වලදී  දෙබස් හසුරවන ආකාරය පහත සබැඳියෙන් නරඹා මතකය අලුත් කරගන්න.

නාට්‍ය ධර්මී ශෛලියේ සංවාද භාවිතය

https://youtu.be/wJ2Mi09hGuI

ලෝක ධර්මී ශෛලියේ සංවාද භාවිතය

https://youtu.be/C1qr1vry39I

දික්තල කාළගෝල නාට්‍යයේ දෙබස් හා සංවාදයන් නාට්‍ය ධර්මී නාට්‍ය ශෛලියට අනුව ඉදිරිපත් වෙයි. සම්පූර්ණ නාට්‍යටම අදාළ දෙබස් ඉදිරිපත් කර ඇති සබැඳියක් පහත දක්වා ඇත.එම සබැඳිය හරහා පැහැදිලිව නිසි ආකාරයෙන් දික්තල කාළගෝල නාට්‍යයේ දෙබස් හා සංවාදයන් උච්චාරණය කරන ආකාරය අධ්‍යනය කරන්න.

දික්තල කාළගෝල නාට්‍ය හඬ පටය

https://youtu.be/PknpM-IFSpU

ඉහත කුමන ශෛලියකට අනුව දෙබස් හා සංවාදයන් ඉදිරිපත් කලද එය ඉදිරිපත් කරනු ලබන නලුවා හෝ නිළිය පහත කරුණු පිළිබඳව අවබෝධය තබා ගත යුතුය.

**●පැහැදිලි උච්චාරණය රංගයට උපකාරී වන බව,**

**●දෙබස් හා සංවාදයන් මගින් චරිත ස්වාභාවය හා සිද්ධි,අවස්ථා මතු කළ යුතු බව,**

**●චරිතය ප්‍රේක්ෂකයා වෙත සමීප කරවීම සිදු කරන්නේ දෙබස් හා සංවාදයන් මගින් බව,**

**●සංවාද හා දෙබස් භාවිතයේදී චරිතයේ ජීව ගුණය රැකෙන පරිද,භාව ප්‍රකාශනයන් සිදු කරමින්  ඉදිරිපත් කිරීම් සිදු කළ යුතු බව.**

**●රංග ශෛලියට උචිත විය යුතු බව,**

**●නිර්වුල් බව හා හඬ පාලනය සිදු විය යුතු බව**

මෙම සියලු කරුණු පිළිබඳව මතකයේ තබා ගනිමින් ඉහත සබැඳි ඔස්සේ අත්දැකීම් එකතු කරගනිමින් දික්තල කාළගෝල නාට්‍යයේ දෙබස් සංවාදයේ යෙදීමට උත්සහා කරන්න.